# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2046/57 – 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා – 2017.11.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 2017 අංක 08 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

2017.09.26 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.10.31 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**සබරගමුව පළාතේ පළාත් සභාව**

*සබරගමුව පළාත් සභාවේ, 2017 අංක 08 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය*

2017.09.26 වන දින සභා සම්මත කරන ලදුව 2017.10.31 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2017 අංක 08 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 නොවැම්බර් මස 14 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.


1A – PG 3775 – 12 (2017/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාවේ, 2010 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය මගින් සංශෝධනය වූ 2009 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය.***

1). මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2017 අංක 08 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේය.

2). 2010 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය මගින් සංශෝධනය වූ 2009 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියෙහි දෙවන උප ලේඛනයෙහි සඳහන් 8102, 8103 හා 8313 යන අත්තිකාරම් ගිණුම්වල සීමාවන්, මෙහි පළමු උප ලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

***2010 - ඇස්තමේන්තු***

***වෙනත් අත්තිකාරම් ගිණුම් කටයුතු***

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම් වල උපරිම සීමාව |
| ***වෙනත් අත්තිකාරම් ගිණුම්*** | | | | | | | |
| 27 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 8102 | මුද්‍රණාල අත්තිකාරම් ගිණුම | 3,100,000 | 1,000,000 | 3,800,000 | 500,000 |
| 28 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 8103 | පරිගණක ව්‍යාපෘතිය | 800,000 | 250,000 | 260,000 | 50,000 |
| 30 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8313 | කුඩා කර්මාන්ත වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය | 5,000,000 | 2,100,000 | 2,000,000 | 1,025,000 |

* සටහන - 2010 අයවැය ඇස්තමේන්තු පොතෙහි පරිගණක ව්‍යාපෘතිය අත්තිකාරම් ගිණුම 8102 ලෙස සටහන් වී ඇත.

12 - 204

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.